





ඕස්ට්‍රේලියාවේ අධ්‍යාපනය නිමකර දැනට ස්ථිර පදිංචිය අපේක්ෂාවෙන් සිටින වයස 23 උඩ අඩි 5 අඟල් 4 රෝමානු කතෝලික ලංකාවේ සැළකිය යුතු දේපලකට හිමිකම් කියන පැහැපත් ගුණ යහපත් දියණියට සුදුසු සහකරුවකු මාපියෝ සොයති. ඊමේල් lwnpeiris@yahoo.com.au දුරකතන 03 8510 0095 හෝ 94 31 2253990

NSMP 191

ඕස්ට්‍රේලියාවේ පුරවැසිභාවය හිමි 28 හැවිරිදි රූමත් පැහැපත් ඩිප්ලෝමාධාරී රැකියාවැති දියණියට සුදුසු සහකරුවකු ඕස්ට්‍රේලියාවේ පදිංචි මාපියෝ සොයති. කෙටි අසාර්තක විවාහයකින් වෙන්වී ඇත . බේධ නොසැළකේ. පිළිතුරු සන්නස බාරේ එවන්න.

NSMP 183

Sister in Australia seeking partner for her sister, currently managing family business in Sri Lanka, financially secured. Slim 40, 5’ 2’’ pleasant, well mannered widow. Please reply with details dammie70@yahoo.com

NSMP 178

සිංහල කතෝලික උස අඩි 5 අඟල් 5 වයස අවුරුදු 38 මනා පෙනුමැති විද්‍යා උපාධිදාරී දැනට මෙල්බර්න් හි උසස් අධ්‍යාපනය හදාරණ පවුලේ බාල දියණියට සුදුසු යහපත් සහකරුවකු සොහොයුරෝ සොයති දෙමාපියන්ද සමග එවුලේ සැම ඔස්ට්‍රේලියාවේ ස්ථිර පදිංචිව සිටිති දුරකතන 9799 3797 (රාත්‍රි 7න් පසුව) email chandaniea@gmail.com

NSMP 179

කොළඹ ජාත්‍යන්තර ආයතනයක ගණකාධිකාරිනියක ලෙස සේවය කරන දියණියට සුදුසු සහකරුවකු දෙමාපියෝ සොයති. වයස 34 උස අඩි 5 අඟල් 3 දුරකතන 03 98017190

NSMP 181




ඕස්ට්‍රේලියාවේ පදිංචි රැකියාවක නියුතු වයස 27 උස අඩි 5 අඟල් 10 රෝමානු කතෝලික ලංකාවේ දේපල හිමි ගුණ යහපත් පුතුට සුදුසු සහකාරියක් මව්පියෝ සොයති ඊමේල් lwnpeiris@yahoo.com.au දුරකතන 03 8510 0095 හෝ 94 31 2253990

NSMP 192

G/B Kandyan parents, presently holidaying in Melbourne, seek educated, pretty daughter with good values for eldest-son, 28-yrs, 5'11, non-smoker, handsome with attractive personality and great family values. Trinitian graduated, presently reading for his Masters in Business Administration at Deakin University, Director for two hotels owned by father in Sri Lanka.
Email: sarath1199@gmail.com

NSMP 189

එංගලන්තයේ පදිංචි පළමු විවාහයෙන් දික්කසාද වූ වයස අවුරුදු 41 උස අඩි 5 අඟල් 11 කඩවසම් සොහොයුරාට ඕස්ට්‍රේලියාවේ ස්ථිර පදිංචි සහකාරියක් සොයයි. බේද නොසැළකේ. සියලුම විස්තර සන්නස බාරේ හෝ ඊමේල් ලිපිනයට එවන්න.
shain.rock@yahoo.com.au

NSMP 190

මෙල්බන්හි ස්ථිර පදිංචි 34 වියැති පුතුට වයස 28 ට අඩු රූමත් චරිතවත් සුදුසු සහකාරියක් දෙමාපියෝ සොයති කේන්ද්‍රරය හා පින්තූරයක් සමග විමසන්න ශ්‍රී ලංකාවෙන් පැමිනි සිසුවියක් හෝ කම් නැත
cristhem@gmail.com

NSMP 187

B/G parents in SL looking for a suitable daughter for their only son 35 yrs, 6.2, handsome, non smoker and teetotaller. Self employed as an architectural draftsman in Sri Lanka , willing to migrate. Only sister PR/Australia. Email:rpasumudith@gmail.com or contact +94374994763

NSMP 188

sri lankan construction tradesman, age 35, height 5' 5" [with skilled visa] seeks a compatible partner for marriage. contact-
chandana.75@hotmail.com
Mobile 0431275776

NSMP 186

දැනට ඕස්ට්‍රේලියාවේ අධ්‍යාපනය ලබන වසස අවුරුදු 35 ක් සහ උස අඩි 5 අඟල් 6 වන වෘශ්චික ලග්නයේ සොහොයුරාට ඕස්ට්‍රේලියාවේ ස්ථිර පදිචිය ඇති සුදුසු සහකාරියක ඕස්ට්‍රේලියාවේ පදිංචි සොහොයුරිය සහ සොහොයුරා සොයති සියලු විස්තර tperera@iprimus.com.au ඊමේල් ලිපිනයට ලියන්න

NSMP 185

38 වන පිටෙන්

## නිව් සවුත් වේල්සයෙහි සංස්ථාපිත

සාමාජිකත්වයෙන් ලැබෙන ශක්තිය ද ඉමහත්ය.

2010 ඔක්තෝම්බර් 31 වැනි ඉරු දින ඩන්ඩාස් ඃමබ්ි* ප්‍රජා ශාලාවෙහි පැවති මහා සභා රැස්වීමෙහිදී 2010/2011 වසරට නව නිලධාරී මඩුල්ලක් තේරී පත්විය. එහි සභාපති ධූරයට ආචාර්ය මහේෂ් බණ්ඩාර, උප සභාපතිවරුන් ලෙස දයා සිරිවර්ධන (අධ්‍යාපන), නිශ්ශංක ධර්මරත්න (සංස්කෘතික), අජිත් එඩිප්පුලිආරච්චි (මාධ්‍ය), නිමල් රන්ජිත් රත්නායක (තරුණ), සම ලේකම්වරුන් ලෙස එස්. පී. ජී. මහානාම (මහජන නිලධාරී) සහ දේවිකා සිටිනාමළුව, භාණ්ඩාගාරික ලෙස රන්ජන් ද සිල්වා, සංස්කාරිකා ලෙස දීපිකා ශ්‍රියාණි සුන්ද්‍රා වඩුගේ, කමිටු සාමාජිකයන් ලෙස රෙජී දිසානායක, ජයසිරි ලියනපතිරණ, ආචාර්ය ඥාණතිලක හේවාගමගේ, හේවා කටුවන්දෙනිය, සුජී හෙට්ටිආරච්චි, තිස්ස ඒකනායක, චමිල වීරබාහු, සමන්ත විමලසිරි, කුලසිරි ජයසිංහ හා පුලතිසි මාලගම යන මහත්ම මහත්මීන් පත්විය.



දීපිකා ශ්‍රියාණි සුන්ද්‍රා වඩුගේ

සිංහල සංස්කෘතික හමුවෙහි වත්මන් සභාපති ආචාර්ය මහේෂ් බණ්ඩාර ඇතුළු නිල මඩුල්ල විසින් සමාරම්භක සභාපති සෝමරත්න දිසානායකයන් ඇතුළු එම වසරෙහි නිලධාරී මඩුල්ලට හා හිටපු සභාපතිවරුන්ට ඔවුන් කරන ලද සේවයට කෘතවේදීත්වය පුද කිරීම හා නව කමිටුව හඳුන්වා දීමෙහි අරමුණෙන් නොවැම්බර් 7 වැනි ඉරු දින සැදෑවෙහි ක්‍රෙස්ට්වුඩ් බාලදක්ෂිකා පියසෙහිදී (Crestwood Girl guide hall) ප්‍රිය සම්භාෂණයක් පවත්වන ලදි. එහිදී සෝමරත්න දිසානායක, වෛද්‍ය බණ්ඩාර සෙනෙවිරත්න, පද්මිණී පිරිස්, මාලා අබේවික්‍රම , කිත්සිරි කරුණාරත්ත, නිහාල් ප්‍රනාන්දු, හා මහින්ද කරුණාරත්න, යන මහත්ම මහත්මීන් විසින් සිංහල සංස්කෘතික හමුවෙහි අතීතය ගැන මෙන්ම එහි අනාගතය කුමක් විය යුතුද යන්න ගැන සමාලෝචනයක් සිදු කරන ලදි. නව කමිටුව පාර්ශ්වයෙන් අජිත් එඩිප්පුලිආරච්චි, ජයසිරි ලියනපතිරණ හා ආචාර්ය මහේෂ් බණ්ඩාර යන මහත්වරු රැස්ව සිටි සැම ඇමතූහ.

විවිධත්වය අගය කරන ඕස්ට්‍රේලියානු ජන සමාජය තුළ සමාජානුගතව, එහි හැදෙන වැඩෙන අපේ දරුවන්ට, තම දෙමාපියන් ජීවත් වන උප සංස්කෘතියට සාර්ථකව අනුගතවීමටත්, සංස්කෘතීන් දෙක හොඳින් ගලපාගෙන ජීවත් වීමටත්, අවශ්‍ය ආකල්ප පෝෂණය කිරීමෙහිලා, සිංහල සංස්කෘතික හමුව ඉටුකරන්නේ වැදගත් කාර්‍යය භාරයකි. තරුණ දූ පුතුන් ද සැබෑ කොටස් කරුවන් ලෙස දායක කර ගනිමින්, ජාතික හා ආගමික, සාමාජීය හා සංස්කෘතිකමය වැඩ සටහන්ද, උත්සව, ප්‍රසංග පමණක් නොව උතුරු පැරමටා, බ්ලැක්ටවුන්, සහ මින්ටෝ යන නමින් සිංහල පාසල් තුනක්ද පවත්වා ගෙනයමින් කාලින වූ මෙහෙවර රැසක නියමුවා ලෙසද කටයුතු කරයි.

මෙවන් අගනා සමාජ මෙහෙවරක නියැලීමට, සිංහල සංස්කෘතික හමුවට තිබූ සැබෑ ශක්තිය වූයේ -හමුවේ” අභිමතාර්ථ හා අරමුණු සාක්ෂාත් කරගනුවස්, දිවා රෑ නොබලා ස්වේච්ඡාවෙන් ඇප කැප වී වැඩ කළ, පරාර්ථකාමී පිරිසකගේ නොපසුබස්නා උත්සාහය හා ධෛර්යයි. මොවුන්ගේ මෙම නොමසුරු දායකත්වයත්, මෙය වටා එක් රොක් ව නිරන්තරයෙන්ම සහයෝගයෙන් කටයතු කළ පුළුල් සාමාජිකත්වයත් නොවන්නට, සිංහල සංස්කෘතික හමුව නම් වූ සංවිධානය උපන් ගෙයිම මියැදෙන්නට ඉඩ තිබුණි.

එදා මෙදාතුර අප සිංහල සංස්කෘතික හමුවෙහි යහපැවැත්ම හා ප්‍රගමනය වෙනුවෙන් පුරෝගාමී වූ සියලු දෙනාටමත්, චිරාත් කාලයක් මෙලෙස ක්‍රියාකාරීව පවත්වා ගැනීමට ශක්තිය සපයන හා සැපයූ පුළුල් සාමාජිකත්වයට ද, ආරම්භයේදී පළ කළ පුවත් හසුනෙහි සිට එය හරබර නිර්මාණ රැසකින් ත්‍රෛමාසිකව දොරට වඩින සිංහල සඟරාවක් බවට පත් කිරීම දක්වා පුරෝගාමීව ඇප කැප වී වැඩ කටයුතු කළ සියළු දෙනාටමත්, 2010/2011 වසර සඳහා තේරීපත්වූ නව කමිටුව වෙනුවෙන් කෘතවේදිත්වය සහ ප්‍රණාමය පුදකර සිටින්නෙමු.

දීපිකා ශ්‍රියාණි සුන්ද්‍රා වඩුගේ

33 පිටෙන්

කලබලයෙන් ලියන ලියවිලිවල වැකි දෙස් ඇති වීම සොබාවය්. සමහර විට යතුරු ලියමනේ දීත් වැකකි දෙස් ඇතිවේ. අත් පිටපතේ ඇති විදියට වඩා යතුරු ලියන්නාට හුරු පුරුදු විදිය යතුරු ලියවිල්ලේ වචනවල දක්නට ලැබෙන අවස්තාත් ඇත. කෙසේ වෙතත් පියසේන සුරීන් ලියන බාසාව සරල වීමත් නිවැරදි වීමත් හැම විටම දක්නට ලැබේ. එහෙත් මේ ලිපියේ එන, “විපක්ශ නායකවරයාට මඟ පෙන්වන්නන් හා ගුරුවරුන් කව්රුන් දැය් අපි නොදනිමු.” යන වැකියත් “ඔහුගේ පරපුර රදලයෝ නුනත් පුබුවරුය” යන වැකියත් මා උගත් - මා දන්නා සියබසේ වියරන නියරට වෙනස්ය.

“විපක්ශ නායකවරයාට මඟ පෙන්වන්නෝ කවරහුද යන්නත් ඔහුගේ ගුරුවරු කවරහුද යන්නත් අපි නොදනිමු” හෝ - විපක්ශ නායකවරයාට මඟ පෙන්වන ගුරුවරු කවරහු දැය් අපි නොදනිමු” යන්නත්, - ඔහු ගේ පරපුරේ ඇත්තන් රදලයන් නුනත් ඔහු / ඔව්හු රටේ /පලාතේ පුබුවරුය.” යන්නත් නිවැරදි යය් සිතමි.

“මා මෙහි කැඳවුයේ කවරෙක්දැය් (කැඳවුවෝ කවරහු දැය්) මම නොදනිමි.”
“ඒ රැස්වීම ඇමතුවේ කවරෙක් දැය් (ඇමතුවෝ කවරහු දැය්) මම මාමාගෙන් ඇසීමි.”

“මාමාට බැන වැදුනේ කවරෙක් දැය් (බැන වැදුනෝ කවරහු දැය්) අපි නොදනිමු / නොදනුමු.

“ඔහුගේ පැරනි ගුරුවරයකු / ගුරුවරුන් ඔහුට උපදෙස් දෙතැය් / දෙතිය් කියති” (ඇසු දේ කීම)

“ඔහුගේ පැරනි ගුරුවරයකු / ගුරුවරුන් ඔහුට උපදෙස් දෙතැය් / දෙතිය් සිතමි.” (සංශයාර්තය)
“බලයෙන් මත්වීම” ලිපිය සඳහා දක්වා ඇති නිදසුන් ද මෙයට ගත හැකිය.

වි.ක. ධර්මබන්ධු

